# සමාජ සංවර්ධනය සඳහා රූපවාහිනී මාධ්‍ය ශක්‍යතා භාවිත කිරීමේ ප්‍රවණතා



ආචාර්ය ටියුඩර් වීරසිංහ



වර්තමාන ලෝක සංහතික මාධ්‍ය පද්ධතිය තුළ රූපවාහිනිය වඩාත් ප්‍රබලතම සහ බලපෑම් සහිත මාධ්‍ය ලෙස ක්‍රියා කරන බව ප්‍රකටය. කිසිම සැකයකින් තොරව සමකාලීන රූපවාහිනිය ගෝලීය සංහතික සහ විඥාපනික ප්‍රපංචයක් වශයෙන් ක්‍රියා කරමින් ගෝලීය ජීවිතයේ සියලු ක්ෂේත්‍ර කෙරෙහි තීරණාත්මක නොවේ නම් සැලකිය යුතු මැදිහත් වීමක් සිදු කරයි. පසුගිය සියවසේ "අනූව දශකය මැදභාගය වන විට ලෝකයෙහි රූපවාහිනී යන්ත්‍ර දශලක්ෂ 750ක් තිබිණි. දෛනික රූපවාහිනී ප්‍රේක්ෂකයන්ගේ සංඛ්‍යාව කෝටි 250ක් වූ අතර, රටවල් 160කට වඩා රූපවාහිනිය ව්‍යාප්තව තිබිණ." (Barker,1997:27) මේ සියවසේ ප්‍රථම දශකය අවසාන වන විට ලෝකයේ රූපවාහිනී යන්ත්‍ර සංඛ්‍යාව කෝටි 350ක් දක්වාද එහි ප්‍රේක්ෂක සංඛ්‍යාව කෝටි 450ක් දක්වාද වර්ධනය වී ඇති අතර, එය ලෝකයෙහි රටවල් 200කට ආසන්න සංඛ්‍යාවක පැතිර පවතී. වර්තමානයේ මානව සංහතිය සතු ප්‍රාදේශීයව, ජාතිකව, කලාපීයව සහ ගෝලීයව ක්‍රියාත්මක වන රූපවාහිනී නාලිකා සංඛ්‍යාව 15000කට අධිකය. අද්‍යතන රූපවාහිනිය ගෝලීය මට්ටමින් පමණක් නොව එය ජාතික සහ කලාපීය මට්ටමින්ද දශලක්ෂ සංඛ්‍යාත සංහතිකයන් වෙත සිදු කරනු ලබන බලපෑමත්, එසේම ජාතික සහ ගෝලීය රූපවාහිනී වැඩසටහන් අන්‍යෝන්‍ය වශයෙන් මිශ්‍රතව සිදු කරනු ලබන බලපෑමද සැලකිල්ලට ගත යුතු වන්නේ රූපවාහිනිය පාදක කොටගෙන සිදු වන සංස්කෘතික ගෝලීයකරණය කෙරෙහි පමණක් නොව එය මානව ජීවිතයේ සමාජ, ආර්ථික, දේශපාලන ඇතුළු සමස්ත සමාජ සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහි සක්‍රීය බලපෑමක් සිදු කරනු ලබන නිසාය.

වර්තමාන මානව සංහතියේ සංවර්ධන මට්ටම එහි සංවිධාන ස්වරූපය සහ එහි සමාජ පරිණාමයේ අනාගත දිශානතිය කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදු කිරීමට සමත් සංහතික මාධ්‍ය පද්ධතියේ පුරෝගාමී ආයතනය ලෙස රූපවාහිනිය හැඳින්විය හැකිය.

මානව සමාජ සංවර්ධනය සහ අදාළ සමාජයේ විඥාපන (තොරතුරු) ක්‍රියාකාරීත්වය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතී. මානව සමාජයේ ඓතිහාසික පරිණාම ක්‍රියාවලිය තුළ නිරීක්ෂණය කළ හැකි පැහැදිලි ප්‍රවණතාවක් වන්නේ මානව සමාජයේ සංවර්ධනයත් සමඟම ඊට සමගාමීව තොරතුරුවල (විඥාපනික) භූමිකාව වර්ධනය වීමයි. මේ නිසා සංහතික තොරතුරු ක්‍රියාවලියේ සංහතික මාධ්‍යකරණයේ, සංහතික ප්‍රවෘත්තිකරණයේ ඉතිහාසය අධ්‍යයනය කිරීම පුද්ගලයාගේ සංවර්ධනය සහ ඔහුගේ මනඃකල්පිත තත්ත්වයන් අවබෝධ කර ගැනීමට අවශ්‍ය සාධකය පමණක් නොව සමස්ත සමාජ සංවර්ධනය සඳහා සංහතික තොරතුරු ක්‍රියාවලියේ ස්වභාවය සහ එහි නියමානුකූලතා බලපාන ආකාරය වටහා ගැනීම සඳහා ද අතිශයින්ම වැදගත් වන බව අපගේ හැඟීමයි.

මානව සංහතියේ ඓතිහාසික පරිණාමයෙහි තීරණාත්මක සන්ධිස්ථානයක් සලකුණු කරන්නේ පූර්ව මානවයන්ගේ සංඥාර්ථවේදය පාදක ක්‍රියාකාරීත්වයට පරිවර්තනය වීමයි. මෙය ඔවුන්ගේ පූර්ව ශ්‍රම ස්වරූප ක්‍රියාවලියක් වන අතර ඊට සමගාමික වියුක්ත චින්තනය, පරිකල්පනය අභිනතියන්, භාෂාව ආදි සමාජීය ගතිලක්ෂණ වර්ධනය වී, එය ක්‍රමානුකූලව පූර්ව මානවයන්ගේ දෛනික පාරිභාරික හා ජීවන ක්‍රියාකාරීත්වයෙහි සංයුක්ත, අවියෝජනීය සංරචකයක් බවට පත් වූ බව පෙනේ. යථාර්ථය සංකේතානුසාරිකව අවබෝධ කර ගැනීම සහ තොරතුරු හුවමාරු කර ගැනීමේ ස්වරූප බිහි වන්නේ මානව සංහතියේ ප්‍රාරම්භකම අවධියේ සිටය. එය අපේ වානර පූර්වජයා රැළ වැසි සතකු විය. රැළ වැසි නොවන ක්ෂණික පූර්වජයන්ගෙන් සතුන් අතුරින් අති සමාජීය සත්වයා වන මිනිසාගේ පැවැත්ම බලාපොරොත්තු වීම කොහෙත්ම කළ නොහැකිය. මේ අන්දමට ප්‍රාථමික වානර පූර්වජයා රැළ වැසි තත්වයේ සිට මානව සම්බන්ධතා හැඩගැසීම සඳහා වූ පරිවර්තනය වීමේදී මේ ප්‍රාථමික ශ්‍රම ස්වරූප සුවිශාල කාර්යභාරයක් ඉටු කළේය. මීට සමගාමීව සංදේශන ක්‍රියාවලිය බිහි වූ අතර එය ක්‍රමානුකූලව හැඩගැසෙන්නා වූ මානවයන් අතර සංකීර්ණ සංඥාමය ක්‍රියාකාරකම් වර්ධනය වීමට සහ විවිධ වූ ශානරීය (ප්‍රභේද) ස්වරූප ද වර්ධනය වීමට තුඩු දුන්නේය. පූර්ව මානවයන්ගේ මූලික ශ්‍රම ක්‍රියාකාරකම් සංකීර්ණ වත්ම ඔවුන්ගේ ව්‍යවහාරික සහ ප්‍රායෝගික කටයුතු වර්ධනය වත්ම ඊට සමගාමී සංකීර්ණ තොරතුරු ක්‍රියාකාරීත්වයක අවශ්‍යතාවද වර්ධනය වන්නට විය. ඒ අනුව අවට සමාජ පරිසරය පිළිබඳව සහ මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳව පොදු සාමූහික ජන මතයක් නිර්මාණය වීම සිදු වූ අතර මේ අනුව තොරතුරු සහ ජනමතය අතර සම්බන්ධතාව මේ කාලයේ සිටම ජීවිතය පිළිබඳ ආකල්පයත් ඇති කර ගැනීම සඳහා වැදගත් විය.

සාපේක්ෂ වශයෙන් සංශෝධිත රාජ්‍ය ස්වරූපයන් හැඩගැසීමත් සමඟ සමාජ ශ්‍රම විභජන ක්‍රියාවලිය සංකීර්ණවීමත් ක්‍රමානුකූලව දේශපාලන ආයතන නිර්මාණය වන්නටත් වූ අතර වෘත්තිය දේශපාලඥයන්ද බිහි විය. මේ කාලය වන විට ජන මතය නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේදී කථිකයන් සුවිශාල භූමිකාවක් ඉටු කළ බව සඳහන් කළ යුතුය.

පුරාතන යුගයේ සිට වර්තමානය දක්වාම සමාජ කථිකයන්ගේ ජනාකර්ෂණීය ඉදිරිපත් කිරීම් සංහතික විඥාපන මාධ්‍ය ක්‍රියාකාරිත්වයේ වැදගත් ස්වරූපයක් ලෙස පවතියි. සමාජයෙහි ස්ථාවර භාවය සහ රාජ්‍යයෙහි දෘෂ්ටිවාදී පොදු බව ආරක්ෂා කර ගැනීම සඳහා රාජ්‍ය පාලකයන් මේ සමාජ කථිකයන්ගේ සේවය ලබා ගත්තේය. සංහතික ව්‍යාපාර නියෝජනය කරන ලද ආගමික නායකයන් සහ ආගමික ස්ථාන ඉතා පුළුල් ලෙස මේ සමාජ කථික සම්ප්‍රදායන් භාවිතයට ගත් බව පෙනේ. එසේම 18 වන සිය වසේ සමාජ දේශපාලන ක්‍රියාකාරීත්වයේ කැපී පෙනෙන කොටසක් ලෙස කථිකයන්ගේ ක්‍රියාකාරීත්වය පත් වූ අතර ඉන් අනතුරුව එය යුරෝපා සහ ලෝක දේශපාලන සංස්කෘතියේ සංයුක්ත කොටසක් බවට පත් විය.

සංගතික විඥාපනික ක්‍රියාකාරීත්වයේ වාචික ස්වරූප සමගම එහි ඇති ලිඛිත ස්වරූපයද වර්ධනය වන්නට වූ අතර ඉන් අනතුරුව පත්‍රිකා බිහි විය. ඒවා පාදක කර ගෙන සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථී ලේඛනවේදීය (Publicism) ප්‍රභේද බිහි වී ව්‍යාප්ත විය. පසුව එය පුළුල් සංහතික මාධ්‍යකරණ ක්‍රියාවලිය තුළට අන්තර්ග්‍රහනය විය.

මේ පුරාතන ලෝකයෙහි බිහි වූ සියලු සමාජ සන්නිවේදනයේ ස්වරූප ප්‍රාග් සංහතික මාධ්‍යවේදීය ප්‍රපංච ලෙස බිහි වී ඒවා අනාගත සංහතික මාධ්‍යයෙහි පදනම බවට පත් වූ බව නිරීක්ෂණය කළ හැකිය.

පුරාතන ලෝකයෙහි පවා දෛනිකත්වය සහ කාලීනත්වය යන තත්වයන් වඩ වඩාත් දැනෙන්නට වූයේ සාමාන්‍ය සමාජ ජීවිතයට බලපාන විවිධ ක්‍රියාකාරකම් (ගැටුම්, යුද්ධ, සටන්) වර්ධනය වීම නිසාය. මේ නිසා නිති පතා එම සිදුවීම් පිළිබඳව තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතාව මතු විය. මෙය පැරණි ඊජිප්තුවේ, ජපානයේ, විශේෂයෙන් රෝමයේද දක්නට ලැබිණ. ක්‍රි.පූ. 59දී පමණ රෝමයේදී ප්‍රකාශයට පත් වූ 'Acta Diurna' (දිනපතා ප්‍රවෘත්ති) මේ නමින්ද අදහස් වන පරිදි දෛනික වාර්තා ඉදිරිපත් කිරීමේ නව්‍ය මානව නිර්මාණකරණයේ ක්‍රියාකාරී ක්ෂේත්‍රයක සංවිධානාත්මක සහ විධිමත් ස්වරූපයක් වන වර්තමානයේ අප ප්‍රවෘත්තිකරණය (Journalism) ලෙස භාවිත කරන දෛනික ප්‍රවෘත්තිකරණයේ සමාජ දේශපාලනය භාවිතය ආරම්භ විය.


මේ නව නිර්මාණකරණයේ ස්වරූපය වන ප්‍රවෘත්තිකරණය හෝ සංහතික මාධ්‍යකරණය සිය ඉතිහාසය තුළ විවිධ අවධි ඔස්සේ සංවර්ධනය වෙමින් එහි විවිධ ස්වරූප සහ ප්‍රභේද ප්‍රකට කරමින් අද්‍යතන මානව සංහතියේ සමාජ සහ පෞද්ගලික සංවර්ධනය කෙරෙහි තීරණාත්මක ව බලපාන සමාජයීය ආයතනයක් බවට පරිවර්තනය වී ඇත.

මෙහිදී අපගේ විශේෂ අවධානය යොමු වන්නේ මානව සංහතියේ ක්‍රියාකාරීත්වයේ සුවිශේෂ ක්ෂේත්‍රයක් වශයෙන් දෛනික සංහතික විඥාපනික (තොරතුරු) ක්‍රියාවලිය විශේෂ ශ්‍රව්‍ය - දෘශ්‍ය ස්වරූපයක් නියෝජනය කරන රූපවාහිනී මාධ්‍ය සමාජ සංවර්ධනයෙහි ලා යොදා ගැනීමේ ශක්‍යතාව විමසා බැලීම සඳහායි.

පොදුවේ සමස්ත සංහතික මාධ්‍යයේම ගතිලක්ෂණ සමුදාය රඳාපවතින්නේ අප කිසිවක් මත නොව දෛනික සංහතික විද්‍යාපනික ක්ෂේත්‍රය මතය. මෙම දෛනික සංහතික විද්‍යාපනික ක්ෂේත්‍රය සංයුක්ත කරනු ලබන්නේ සාමාන්‍ය මානව පාරිභාරික ජීවිතයේ විවිධ ක්‍රියාකාරකම් සහ ප්‍රපංචයන් තුළිනි. දේශපාලනික, ආර්ථික, සංස්කෘතික, සමාජීය, කලාත්මක දෘෂ්ටිවාදීය, අධ්‍යාත්මික මෙන්ම ජාතික සහ ජාත්‍යන්තර අවකාශය තුළ සිදු වන සමාන්‍ය සංහතික ජීවිතය ස්පර්ශ කරන අතිවිශාල සිදුවීම් ක්‍රියාවලීන් සහ ප්‍රපංචයන් ඊට ඇතුළත් වන්නේය.

සමකාලීන මානව සංහතියේ මානවද්‍රව්‍ය හැඩගැස්වීමේ ක්‍රියාවලිය තුළ තීරණාත්මක භූමිකාවක් හිමි කර ගෙන ඇත්තේ ශ්‍රව්‍ය - දෘශ්‍ය සංහතික මාධ්‍ය බව අවධාරණය කළ යුතුය. විශේෂයෙන්ම එහිදී රූපවාහිනියට අතිවිශාල කාර්යභාරයක් පැවරී තිබේ. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව සංහතික ජීවන අවකාශයට ඉතා පුළුල් ලෙසත් ගැඹුරු ලෙසත් අවතීර්ණ වූ රූපවාහිනිය ඊට ආවේණික සියලු ගතිලක්ෂණ විදහා දක්වමින් සහ ප්‍රකට කරමින් මානව වර්ගයාගේ සමාජ - දේශපාලන, සංස්කෘතික, ආධ්‍යාත්මික පරිණාමය කෙරෙහි යුගකාරක විපරිවර්තනයක් ඇති කරමින් මානව සංහතියේ අනාගත සමාජ පරිණාමය පිළිබඳ ව නව මානයකින් සලකුණු කළේය.

මේ විසි එක් වන සියවසේ දෙවන දශකයට අවතීර්ණ වී තිබෙන ගෝලීය සංහතික මාධ්‍ය අවකාශය තුළ තිරස්ව මෙන්ම සිරස් බව ද ගැඹුරු සහ පුළුල් විපර්යාසයන් රාශියක් සිදු වෙමින් ඒවා මහා පාරිමාණික සහ ආපසු හැරවිය නොහැකි ගතිලක්ෂණ අත්පත් කර ගත් ප්‍රවණතාවක් ඔස්සේ ගමන් කරමින් සිටී. නව විද්‍යාපනික සන්නිවේදන තාක්ෂණවේදය පාදක කොට ගෙන මීට පෙර නොවූ විද්‍යාපනික සන්නිවේදන අවකාශයක්, පරිසරයක් නිර්මාණය වී ඇති අතර එහි මිනිසාට අවශ්‍ය සංහතික අන්තර්ගතයන් සහ සේවා ඒකීය පද්ධතියක් තුළ ක්‍රියාත්මක වන්නේය. මේ සන්දර්භය තුළ නව මිනිසෙක් "homo informaticus" හැඩගැසෙමින් පවතින්නේය. මෙම ක්‍රියාවලිය ගෝලීය පරිමාණික ස්වරූපයක් ගන්නා



අතර මානව ශිෂ්ටාචාරයේ මූලයන් යළි සලකා බැලීමකට යොමු කරවන්නේය.

මේ විද්‍යාපනික - සන්නිවේදන ක්ෂේත්‍රයෙහි සිදු වන ගැඹුරු ප්‍රතිව්‍යුහාත්මක ප්‍රවණතාව සමස්ත මාධ්‍යවේදිත අවකාශයම ස්පර්ශ කරන්නේය. සංහතික මාධ්‍ය පද්ධතියේ ගැඹුරු විපර්යාසයන්ට ලක් වන්නේ එහි තාක්ෂණික පැතිකඩ පමණක් නොව එහි ආර්ථික, වාණිජ, අවකාශීය පැතිකඩ සහ සංස්කෘතික පැතිකඩද ගැඹුරු විපරිවර්තනයකට ලක් කරමින්ය.

අප මේ ඉහත ගෙනහැර දක්වන ලද ක්‍රමවේදීය ප්‍රවේශය තුළ සමකාලීන රූපවාහිනිය සමාජ සංවර්ධනයෙහි ලා භාවිත කිරීමේ හැකියාව විභාග කළ හැකිය. ඒ අනුව සමකාලීන රූපවාහිනියේ වෙළඳ අවකාශය, රූපවාහිනී නාලිකා, රූපවාහිනී වැඩසටහන්, ඒවායේ නිර්මාණාත්මක විභවයන් සහ වැඩසටහන්වල ගුණාත්මක භාවය ආදිය පිළිබඳව සලකා බැලිය යුතු වන්නේය.

සමකාලීන රූපවාහිනිය, සමාජ සංවර්ධනයෙහි ලා භාවිත කිරීමේ ශක්‍යතාව ගවේෂණය කිරීමේදී එක් අතකින් ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයක් හැටියට රූපවාහිනී මාධ්‍ය ක්‍රියාත්මක සමාජ - දේශපාලන අවකාශයේ ගතිකයන් සම්බන්ධවද අපගේ අවධානය රූපවාහිනී මාධ්‍යයේ නෛසර්ගික අභ්‍යන්තර ගති ලක්ෂණ සම්බන්ධවද අනෙක් අතින් යොමු විය යුතු වන්නේය. මේ නිසා සමාජ සංවර්ධනයෙහි ලා රූපවාහිනී මාධ්‍යය භාවිත කිරීමේ ශක්‍යතාව එක් අතකින් වියුක්තවද අනෙක් අතින් සංයුක්තවද විශ්ලේෂණය කරමින් එය අපෝහකාත්මක සම්බන්ධතාවක් තුළ අවබෝධ කර ගත යුතු වන බව අපගේ වැටහීමයි.

ඕනෑම සංහතික මාධ්‍ය පඨිතයක අන්තර්ගත මූලික ගතිලක්ෂණ හතරක් තිබේ. භාව, ප්‍රතිරූප - සන්දර්ශක, පරමාර්ථ සහ අර්ථ යනු ඒ චතුර්විධ ලක්ෂණ වේ.

චතුර්විධ ගතිලක්ෂණ නිශ්චිත සංහතික මාධ්‍ය පඨිතයක සංයුක්ත වී ඇති ආකාරය අනුව අදාළ පඨිතයේ ගුණාත්මකභාවය, සංහතිකාර්ෂණීයභාවය, ගැඹුර, සරලත්වය, අන්තර්ගතය, ආකෘතිය ආදිය මගින් සංහතික මාධ්‍ය පඨිතයක අදාළ මට්ටම තීරණය වේ.

සියලු සංහතික මාධ්‍ය පඨිත කෙසේ වෙතත්, ශ්‍රව්‍ය දෘශ්‍ය සංහතික මාධ්‍ය පඨිතයක් වන රූපවාහිනියට ආවේණික සුවිශේෂතා හේතු කොට ගෙන එයට රූපවාහිනී ප්‍රේක්ෂකයන්ගේ සංවේදනා, හැඟීම් ස්පර්ශ නොකර සිටිය නොහැකිය. එය ශ්‍රව්‍ය - දෘශ්‍ය ස්වභාවයේ නෛසර්ගික කොටසකි. එසේම ශ්‍රව්‍ය - දෘශ්‍ය ස්වරූපයේ කොටසක් වශයෙන් භාෂණ ගතිලක්ෂණ ද ක්‍රියාකරන්නේය.

මේ අනුව රූපවාහිනී පඨිතයක භාව, ප්‍රතිරූප සන්දර්ශක, පරමාර්ථ සහ අර්ථ යනු චතුර් විධ ලක්ෂණ

අන්තර්ගත වීමේ අනුපාතික ප්‍රමාණය තීරණය වන්නේ රූපවාහිනියේ නෛසර්ගික අභ්‍යන්තර ස්වභාවය මත පමණක් නොව රූපවාහිනියේ ක්‍රියාත්මක වන නිශ්චිත සමාජ - දේශපාලනික පසුබිම ද මත බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

රූපවාහිනිය සමාජ සංවර්ධනයෙහි ලා භාවිත කිරීමේ ශක්‍යතා විමර්ශනය කිරීමේදී ඉහත රූපවාහිනියේ වැඩසටහන්වල සංයුතිය නිර්ණය කෙරෙන චතුර්විධ සංකල්පය පිළිබඳ කේන්ද්‍රීය අවධානය යොමු කිරීම ඉතා වැදගත් බව අපගේ අදහසයි. එසේම සමකාලීන රූපවාහිනියේ සමස්ත සංයුතිය පිළිබඳවද අපගේ අවධානය යොමු විය යුතු වන්නේය.

වර්තමාන ගෝලීය සංහතික මාධ්‍ය සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වන රූපවාහිනී වැඩසටහන්වල පොදු සාමාන්‍ය තත්වයක් දක්නට ලැබෙන අතර ඒවා කුමන මහද්වීපයේ කුමන රටේ ක්‍රියාත්මක වුවද ඒවායෙහි වැඩසටහන් අතර දැකිය හැක්කේ සමජාතීය ලක්ෂණයන් බව කිව යුතුය.

21 වන සියවසේ ආරම්භයේ සිටම ලෝකයේ බොහෝ රටවල ජනප්‍රියතම රූපවාහිනී අලුත් වැඩසටහන් ප්‍රභේදයක් වූයේ යථාකාර රූපවාහිනී වැඩසටහන් (Reality TV Programmes) ය. බ්‍රිතාන්‍යයේ වයස අවුරුදු 4 - 65 අතර රූපවාහිනී ප්‍රේක්ෂකයන්ගෙන් 70%ක් යථාකාර රූපවාහිනී සංදර්ශන වැඩසටහන් නරඹති. බ්‍රිතාන්‍ය දරුවන්ගෙන් 84%ක් යථාකාර රූපවාහිනී සංදර්ශන වැඩසටහන් නරඹති (Hill 2007,p.51). ශ්‍රී ලාංකික රූපවාහිනියේ යුරෝපීය අර්ථයෙන් ගත් කල යථාකාර රූපවාහිනී වැඩසටහන් නොමැති වුවත් ඒවායේ විකෘති වූ ස්වරූපයේ වැඩසටහන් දැකගත හැකිය. සමහර විට ශ්‍රී ලාංකික රූපවාහිනී සංස්කෘතියට අනුව ගොඩනැගී ඇති යථාකාර රූපවාහිනී වැඩසටහන් වශයෙන් ඒවා හැඳින්විය හැකිය. යුරෝපීය යථාකාර රූපවාහිනිය සහ ශ්‍රී ලාංකේය යථාකාර රූපවාහිනිය සංකල්පීය වශයෙන් එකිනෙකට වෙනස් වන්නේය. සමකාලීන රූපවාහිනී යථාකාර සංදර්ශන වැඩසටහන් ඇතුළත්ව සිය වැඩසටහන් සංයුතියෙන් අර්ථ සහ අදහස් සම්පූර්ණයෙන්ම ඉවත් කොට ඇති අතර භාවික සහ ප්‍රතිරූප - සංදර්ශක ලක්ෂණවලින් පමණක් සම්පූර්ණ කර තිබේ. එම නිසා එම වැඩසටහන් නැරඹීමෙන් ප්‍රේක්ෂකයා තුළ යථාර්ථය කෙරෙහි ප්‍රජානන උත්තේජනයක් ඇති නොවේ. මේ අනුව රූපවාහිනී පයීතයක චතුර්විධ සංරචකයන් අතර තිබිය යුතු තුලිතභාවය උල්ලංඝනය කරමින් ශ්‍රව්‍ය - දෘශ්‍ය ස්වරූපය විකෘති කරන්නේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රූපවාහිනී පයීතයේ වැදගත්කම, හරය සහ චිත්තාකර්ෂණීය බව නැති කර ගන්නේය. අනෙක් අතින් රූපවාහිනී ප්‍රේක්ෂකාගාරය සංහතික භාවය නිසාම එය විවිධාකාර වන්නේය. ඒ නිසාම රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදකයන් හට අදහස් සහ අර්ථ හැඩගැස්වීම් වඩා සංකීර්ණ සහ දුෂ්කර ක්‍රියාවලියක් වනු ඇත. එසේම වෙළඳ පොළ නැඹුරුව මෙන්ම දේශපාලන සංස්කෘතිය මෙයට බලපාන්නේය.

මේ අනුව සමකාලීන රූපවාහිනියේ භාවිතය සහ චලන අද්‍යතන වෙළඳ සහ දේශපාලන ප්‍රාග්ධනයේ හැසිරීමට සහ චලනයට සමරූපී වන්නේය. "රූපවාහිනිය අනිවාර්යයෙන්ම සංස්කෘතික ඒජන්තවරයෙක් හෙවත් කාරකයෙකි. එය ජනප්‍රිය සුවය සම්පාදනය කොට ඒවා ප්‍රේක්ෂක ජනයා අතර බෙදා හරින බැවින් රූපවාහිනිය සමාජ ව්‍යුහයට නැතුවම බැරි අංගයක් බවට පත් වී ඇත්තේය." (පෙරේරා, 2001. පි 130). මේ අනුව පෙනීයන්නේ රූපවාහිනිය සිය ඓතිහාසික සාපේක්ෂ වශයෙන් කෙටි කාලය තුළ සිය අභ්‍යන්තර ගතිලක්ෂණවලට අනුකූල වන පරිදි සහ එම ගුණාංගයන් උත්කර්ෂණය වන්නා වූද එසේම මාණවකයන්ගේ පොදු සමාජයීය සංස්කෘතික සහ සමාජ - මනෝ ආඛ්‍යානයන්ට සමපාත වන ආකාරයේ "සමාජ සංහතික සැකැස්මක් නිෂ්පාදනය කොට තහවුරු කොට තිබෙන බවය. රෝලන්ඩ් බාත්ට අනුව "ආඛ්‍යානය ඇරඹෙන්නේ මානව සංහතියේ ඉතිහාසය ආරම්භ වූ දා සිටය. කතාන්දරයෙන් තොර වූ කිසිදු මනුෂ්‍ය කොට්ඨාසයක් එදා මෙදා තුර ලොව පැවති නැත..., කතන්දරය ජාත්‍යන්තරය; සර්ව ඓතිහාසිකය, සර්ව සංස්කෘතිකය. කතාන්දරයත් හරියටම ජීවිතය වාගේය. එය සැමතැනම පවතී (Rolan, 1981, p.79). මේ ඉහත ගෙන හැර දක්වන ලද මානව සංස්කෘතික ක්ෂේත්‍රයේ නිලීන ගතිලක්ෂණ හේතු කොට ගෙන ශ්‍රව්‍ය දෘශ්‍ය පයීතවල පොදු ගෝලීය සමජාතීය තත්ත්වයක් ඇති වී තිබේ. මේ නිසාම රූපවාහිනී මාධ්‍ය ශක්‍යතා ජාතික පමණක් නොව ගෝලීය සංවර්ධනය සඳහා භාවිත කිරීමේදී මුහුණ පාන්නට වන අභියෝගයේ විශාල වෙනසක් දක්නට නොලැබේ.

සමකාලීන ජාතික මෙන්ම ගෝලීය රූපවාහිනිය සමාජ සංවර්ධනයෙහි ලා භාවිත කිරීමේ හැකියාවට වඩා




එය ජාතික සහ ගෝලීය නියාමනයේ, පාලනයේ සහ මෙහෙයවීමේ සංහතික උපකරණයක් වශයෙන් භාවිත වන බව අවධාරණය කළ යුතුය. රූපවාහිනිය කාලීන සහ දෛනික සංවර්ධන අවශ්‍යතා සමාජගත කරනවාට වඩා දෛනිකව සහ අඛණ්ඩව සමාජ ජීවිතයෙහි හටගන්නා සිදුවීම්, ප්‍රපංචයන් සහ ක්‍රියාවලීන් පිළිබඳව තොරතුරු වාර්තා කරමින් එම සිදුවීම් ආධිපත්‍ය දරන පාලක පන්තියේ දෘෂ්ටිවාදයට අනුකූලව අර්ථකථනය කිරීම, ප්‍රතිඅර්ථකථනය කිරීම වර්තමාන රූපවාහිනියේ මුඛ්‍ය භූමිකාව වන්නේය.

සංහතික මාධ්‍ය සන්දේශවල දෘෂ්ටිවාදී සංරචකය කොතෙක් දුරට ප්‍රබලද යන්න අවධාරණය කරන්නේ නම් සංහතික මාධ්‍ය සන්දේශ අපක්ෂපාති හෝ මධ්‍යස්ථයයි ග්‍රාහකයන්ට පෙනී යන අවස්ථාවන්හිදී පවා එහි නිශ්චිතව දිශාගත වූ දෘෂ්ටිවාදී ගතිකයන් නිලීනව පවතී. "විශේෂයෙන්ම මේ තත්වය රූපවාහිනී සහ එහි ප්‍රවෘත්ති සම්බන්ධව සලකා බලන කල පෙනී යනු ඇත." (වීරසිංහ, ඊ., 2011, p. 175).

මේ අනුව අද්‍යතන ජාතික සහ ගෝලීය රූපවාහිනිය සමාජ සංවර්ධනයේ කාරකයකුට වඩා සංහතික සංස්කෘතියේ සහ සංහතික දෘෂ්ටිවාදයේ කාරකයකුගේ භූමිකාව ඉටු කරයි. ප්‍රතිපත්තියක් වශයෙන් රූපවාහිනිය යම් රටක සමාජය සාමාන්‍ය පරිදි පාලනය කිරීමට අවශ්‍ය වන්නා වූ දෘෂ්ටිවාදී වටපිටාවක් නිර්මාණය කරනු ලැබේ. එය එහි මුඛය කාරයභාරයකි. ඊට පිටුපා වර්තමාන රූපවාහිනියට ක්‍රියාත්මක විය හෝ පැවැතිය හෝ නොහැකිය.

පශ්චාත් යුද සංවර්ධන අදියරක පසු වන ශ්‍රී ලංකාවේ රූපවාහිනී මාධ්‍යයේ ක්‍රියාකාරීත්වය විශ්ලේෂණය කර බැලීමේ කාලීන සහ ජාතික අවශ්‍යතාවක් තිබේ. සමකාලීන ශ්‍රී ලාංකික රූපවාහිනියේ සමාජ සංහතික සැකැස්ම සකස් වීමෙහි ලා මූලික වූ සමාජ, දේශපාලන සහ සංස්කෘතික සාධක ත්‍රිත්වයක් පාදක වී ඇති බව පෙන්වා දිය යුතුය. ඉන් පළමු වැන්න දශක රකට අධික කාලයක් තිස්සේ පැවැති පශ්චාත් යටත් විජිතවාදයයි. දෙවැන්න දශක තුනකට ආසන්න කාලයක් පැවැති සංග්‍රාමිකවාදය සහ තෙවැන්න සිංහල බෞද්ධ ජාතිකවාදයයි. වර්තමානයේ පශ්චාත් යටත්විජිතවාදය ක්‍රියාත්මක වන්නේ බටහිර ගෝලීයවාදය ස්වරූපයෙනි. මෙම සාධක පාදක කොට ගෙන සමකාලීන ශ්‍රී ලාංකේය රූපවාහිනියේ සමාජ සංහතික සැකැස්ම නිර්මාණය වී ඇති අතර එය අද්‍යතන ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදු කරන බව ආධාරණය කළ යුතුය.

මෙහිදී රූපවාහිනියේ සමාජ සංවර්ධනයේ භූමිකාවේ



තර්කනය පිළිබඳව කතා කිරීමේදී ජනප්‍රිය කතිකාව තුළ අවධාරණය කෙරෙන, රූපවාහිනිය සමාජ සංවර්ධනය කෙරෙහි බලපාන තර්කනයට ප්‍රතිපක්ෂව සමාජය රූපවාහිනියේ වර්ධනයට බලපාන තර්කනය විශේෂ අවධාරණයකින් යුතුව පෙන්වා දිය යුතුය. වර්තමාන ගෝලීය බටහිරවාදයේ, සංග්‍රාමිකවාදයේ සහ සිංහල බෞද්ධ ජාතිකවාදයේ පෘථුල පරිස්ථිතිය තුළ වර්තමාන ශ්‍රී ලාංකේය රූපවාහිනියේ සමාජ සංහතික සැකැස්ම සහ එහි ක්‍රියාකාරීත්වය සිද්ධ වන්නේය. මේ නිසා අප රූපවාහිනිය තේරුම්ගත යුත්තේ හුදු තොරතුරු ඉදිරිපත් කරන, වාර්තාකරණ සන්නිවේදන මාධ්‍යයක් ලෙස නොව, රූපවාහිනියේ සමාජ සංවර්ධන භූමිකාව බහුමානීය, බහු පර්යාලෝකීය පරාමිතීන්ගෙන් සමන්විත සංස්කෘතික ශික්ෂණ මාදිලියක් ලෙසය; එනම් මානව ද්‍රව්‍යයේ නිර්මාපකයකු ලෙසය. සමාජ සංවර්ධනය සහ මානව ද්‍රව්‍ය අතර ඇත්තේ අවියෝජනීය සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාවකි. මානව ද්‍රව්‍ය පිළිබඳව නොසලකා හැර කිසිමාකාරයක සමාජ සංවර්ධනයක් සාක්ෂාත් කර ගත නොහැකිය. අද්‍යතනයෙහි මානව ද්‍රව්‍ය හැඩගැස්වනු ලබන ප්‍රබලතම මාධ්‍යය බවට රූපවාහිනිය පත්ව තිබේ. මේ අනුව සමකාලීන සමාජ සංවර්ධනයෙහි ලා රූපවාහිනියට පැවරී ඇත්තේ අතිවිශාල වගකීමකි; කාර්යභාරයකි. රූපවාහිනිය සහ මානව සත්තාව අතර පවතින සම්බන්ධතාව සාන්දෘෂ්ටිකවාදි රාමුවක් තුළ අර්ථකථනය කරන්නේ නම් චින්තනය සිය හරය ලබාගන්නේ සත්තාවේ පැවැත්මෙනි. හරයේ සත්තාව යනු පවතින්නාගේ පැවැත්මය. චින්තනයේ මුඛ්‍ය ලක්ෂණය වන්නේ අවබෝධයයි. මේ දෘෂ්ටිකෝණයට අනුව රූපවාහිනිය සිය ශ්‍රව්‍ය - දෘශ්‍ය ස්වරූපයෙන් මිනිසා සඳහා තිබෙන්නා වූ සත්තාව සංයෝජනය කරයි. රූපකමය අකාරයෙන් මිනිසාගේ සංජානනය සක්‍රිය කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස එය චින්තන ක්‍රියාවලියට උපස්තම්භක වේ. මේ අනුව රූපවාහිනිය ප්‍රේක්ෂකයා මුලින්ම තිර රූපකමය සංජානනය ඔස්සේ සත්තාව පිළිබඳ අවබෝධය ලබාගෙන ඒවාගේම එය චින්තනය


දක්වා ගමන් කරන්නේය. රූපවාහිනියට සිය පැවැත්මේ අර්ථය තහවුරු කරන්නා වූ දර්ශනයක් තිබුණේ නම් එයට පුද්ගලයා හෝ ජාතිය හෝ මානව සංහතිය හෝ ශික්ෂණය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ජාතික සහ පෘථිවි පරිමාණික පුරෝගාමියකු වීමට හැකි වන්නට තිබිණ.

මෙහිදී රූපවාහිනිය ආශ්‍රිතව හෝ එය පාදක කොට ගෙන නිර්මාණය වන සමාජ සංහතික සැකැස්ම රටක, සමාජයක, පුද්ගලයකුගේ සංවර්ධනය සඳහා දායක වන ආකාරය අවබෝධ කොට ගැනීමද වැදගත්ය. සමාජ සංහතික සැකැස්ම යනු සමාජයෙහි ජීවත් වන පුද්ගලයන් සංහතික මාධ්‍ය ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරීත්වය පාදක කොටගෙන සංහතික සමාජ සම්බන්ධතා ඔස්සේ සංහතිකයන් බවට පත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය වන සමාජ සැකැස්මකි. මෙය අදාළ රටේ සංහතික මාධ්‍ය සංස්කෘතියේ ප්‍රතිඵලයක් මෙන්ම එහි අභේදනීය සංයුක්ත කොටසකි.

රටක සංවර්ධනය සඳහා රූපවාහිනියේ දායකත්වය පිළිබඳව කතා කිරීමේදී මේ අප ඉහත ගෙන හැර දක්වන ලද සමාජ සංහතික විඥාපන සැකැස්ම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු බව අපගේ හැඟීමයි. ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ බොහෝ රටවල සමාජ - සංස්කෘතික සංවර්ධනය කෙරෙහි රූපවාහිනිය භාවිත කිරීමේ හැකියාව පිළිබඳව පුළුල්ව සහ ගැඹුරින් අධ්‍යයන සිදු වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි.


මේ නිසා විශේෂයෙන්ම අප රට සඳහා මෙම ක්ෂේත්‍රය සම්බන්ධව අධ්‍යයනය කිරීම පුරෝගාමී වන ප්‍රවණතාවක් සලකුණු කරන්නේය. මේ අනුව සමකාලීන රූපවාහිනිය සංහතික තොරතුරු විඥාපනය සමස්ත සමාජ සංවර්ධනයෙහි ලා තීරණාත්මක භූමිකාවක් ඉටු කරන සංයුක්ත කොටසක් වශයෙන් සැලකිය යුතුය. වර්තමානයේ රූපවාහිනිය සංහතික තොරතුරු මාධ්‍යයක් ලෙස සමාජ සංවර්ධන අභිප්‍රේරණයන්, අභිනතීන් සහ ආස්ථානයන් හැඩගැස්වීමෙහි ලා අතිවිශාල කාර්යභාරයක් ඉටු කරන දෛනික බලපෑම් මාධ්‍යයක් ලෙස පමණක් නොව මානව සත්තාවේ පැවැත්ම සහ එහි ක්‍රියාකාරීත්වය සකස් කිරීමේ ක්ෂේත්‍රයක් වශයෙන් සලකා බැලිය යුතු වන්නේය. සමාජ තොරතුරු අද වඩවඩාත් සමාජ සංස්කෘතික සංවර්ධනයේ නිර්ණායකයක් බවට පත් වී ඇත. පුද්ගලයන්, සංහතිකයන් , සමාජ කණ්ඩායම් සහ සමාජ බලවේග සමාජානුයෝජනය, සමාජගත කිරීමේ, දෘෂ්ටිගත කිරීමේ ප්‍රබලතම මාධ්‍යය රූපවාහිනිය බව අවධාරණය කළ යුතුය. විවිධ පරම්පරා අතර සංස්කෘතික, ආධ්‍යාත්මික සහ සමාජීය සම්ප්‍රදායක් අතර විපරිවර්තනික අනුප්‍රාප්තික අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති කිරීමේදී රූපවාහිනී සන්නිවේදන මාධ්‍ය තරම් ප්‍රබල ලෙස පාවිච්චි කළ හැකි වෙනත් විඥාපන මාධ්‍යයක් නැත. නමුත් වර්තමාන ලෝක රූපවාහිනී සන්නිවේදනය විශේෂයෙන්ම බටහිර රටවල භාවිත කරනු ලබන්නේ සමාජ සංස්කෘතික සංවර්ධන අරමුණු සඳහා නොව දශලක්ෂ සංඛ්‍යාත සංහතිකයන් මෙහෙයවීම පාලනය කිරීම සහ සංවිධානය කිරීම මුල් කර ගත් තත්ත්වසංරක්ෂණවාදී අරමුණු සඳහාය. මෙය සමාජ සංවර්ධනය සඳහා යොදා ගන්නවාට වඩා වාසි දායක බව පෙනේ.

මානව සංහතියේ ඓතිහාසික සමාජ විකාශනයේදී ලෝකසංජානනය පිළිබඳ ප්‍රශ්නයේදී විඥාපන අවකාශය දෘශ්‍යකරණය වී ප්‍රබල සහ සර්වාධිකාරීක ප්‍රවණතාවක් බවට පත් වී තිබේ. මෙහිදී රූපවාහිනිය සුවිශේෂ භූමිකාවක් ඉටු කරමින් මහාපරිමාණ අන්දමින් ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදන ප්‍රමාණය සංඛ්‍යාත්මක වශයෙන් වර්ධනය වෙමින් එය සමාජ යථාර්ථය කෙරෙහි නවාකාරයක සම්බන්ධතාවක් හැඩගස්වනු ලැබේ. එම වැඩසටහන්



මගින් සමාජ – ආර්ථික සහ සංස්කෘතික සදාචාරාත්මක ක්‍රියාවලින් උත්තේජනය කරනු ලැබීමට නම් එම තොරතුරු අර්ථභාර සංවර්ධනාත්මක අභිනතියක් දැරිය යුතුය. නමුත් වර්තමාන ශ්‍රව්‍ය - දෘශ්‍ය තොරතුරුවල එවැනි ශක්‍යතාවක් පවතින්නේද යන්න ගැටලුවකි. "තොරතුරු එන්න එන්නම බහුල වන නමුත් එහි අර්ථභාර එන්න එන්නම හීන වන්නේය." (Baudrillard, 1983, p 95). මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය සංහතික තොරතුරු යුගය තුළ ක්‍රියාත්මක ප්‍රවණතාව ශ්‍රී ලාංකේය ශ්‍රව්‍ය - දෘශ්‍ය සංහතික මාධ්‍ය අවකාශය තුළ ඉතා මැනවින් දක්නට ලැබෙන අතර එය කොතෙක් දුර ගොස් තිබේදැයි ප්‍රකාශ කරනවා නම් ප්‍රධාන රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශන පවා අර්ථභාර අන්තර්ගය අබිබවා ඒවායේ ආකෘතිකමය බාහිර සංහතික ලක්ෂණ ඉස්මතු කිරීම සිදුවන්නේ ප්‍රවෘත්තිවල සම්භාව්‍ය වටිනාකම් සම්පූර්ණයෙන්ම අහිමි කිරීමෙනි. විශේෂයෙන්ම ශ්‍රී ලාංකේය රූපවාහිනියේ විකාශය වන වැඩසටහන්වලින් අතිබහුතරය සමාජ සංවර්ධන ගතික උත්කර්ෂණය කරනවා වෙනුවට එය යොමුව ඇත්තේ

උද්වේගකර, සංවේදී සිදුවීම් ලෙස සැලකෙන ත්‍රස්තවාදී ක්‍රියා, අපරාධ, බේදවාචක, ආපදා, දූෂණ, ඝාතන, අනතුරු සහ සංග්‍රාම ආදි සිද්ධීන් වාර්තා කිරීම සඳහාය. ශ්‍රී ලාංකේය රූපවාහිනී නිෂ්පාදනවල අන්තර්ගතය විශ්ලේෂණය කර බලන විට එම වැඩසටහන්වල අවකාශයෙන් සමස්තය නොඑසේ නම් අතිවිශාල ප්‍රතිශතයක් සමන්විත වී ඇත්තේ මනෝරූප සන්දර්ශන සහ භාවයන්ගෙනි. මේ සඳහා විශේෂයෙන්ම මෙගා ටෙලි නාට්‍ය, සාමාන්‍ය මාලානාටක, සඟරාමය වැඩසටහන්, යථාකාරයැයි හඳුන්වනු ලබන Reality TV වැඩසටහන්, සමාජ - දේශපාලන සාකච්ඡා වැඩසටහන්, ප්‍රචාරක දැන්වීම් සම්භාව්‍ය ගණයේ නිදර්ශන ලෙස දැක්විය හැකිය. මීට එක් ප්‍රධාන හේතුවක් වශයෙන් දැක්විය හැක්කේ රූපවාහිනිය වඩාත් වෙළඳපොළ අවකාශය මත රඳාපවතින නිසා රූපවාහිනී වැඩසටහන්වල අන්තර්ගතය හැඩගැස්වීමේදී එය වඩාත් උපයෝගීතාවාදී, වාණිජවාදී සහ සංහතකවාදී ප්‍රවේශයක් ගැනීමය.




ඇත්ත වශයෙන්ම ලෝක මට්ටමේදී රූපවාහිනී සන්නිවේදනය යන සංකල්පය බිහි වන්නේ 1940 දශකය අවසානයේ සහ 1950 දශකය ආරම්භයේදී සංහතික සමාජය සහ සංහතික සංස්කෘතිය පාදක කරගෙන බවද අවධාරණය කළ යුතුය. මේ කාලය තුළ සංහතික තොරතුරු මාධ්‍ය තාක්ෂණයේ විද්‍යුත් ක්ෂේත්‍රය විශාල ලෙස වර්ධනය වන්නට වූ අතර එය 'සංස්කෘතිය රූපවාහිනීකරණය' කිරීම දක්වා දුර දිග ගියේය. වර්තමානය වන විට මුළු මහත් මානව සංස්කෘතිය පමණක් නොව මානව සත්තාවම රූපවාහිනීකරණයට ලක් වී තිබේ. මේ අනුව සමකාලීන මානව ද්‍රව්‍ය හැඩගැස්වීමේ ප්‍රබල මාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය ක්‍රියා කරන අතර අදාළ රටේ සංවර්ධන ක්‍රියාවලිය එහි මානව ද්‍රව්‍යයේ ස්වභාවය මත රඳා පවතී.

අප විසින් ඉදිරිපත් කරන ලද සමාජ සංහතික මාධ්‍ය සැකැස්ම පරිහානිය කරා ගෙන යෑමට සමත් මාධ්‍ය වෛරස සමාජ සංහතික මාධ්‍ය සැකැස්ම හෝ දේහය තුළට විසරණය වීම වර්තමාන ශ්‍රව්‍ය - දෘශ්‍ය සංහතික මාධ්‍ය වැඩසටහන් මගින් සිදු වේ. විශේෂයෙන්ම එය සිදු වන්නේ රූපවාහිනී මාධ්‍ය තුළින් යථාර්ථය නිරූපණය කිරීමේදී හෝ යථාර්ථය පරාවර්තනය කිරීමේදී හෝ යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමේදී හෝ නොව රූපවාහිනී මාධ්‍ය යථාර්ථය සමඟ හරඹ කිරීමේදීය. විශේෂයෙන්ම මෙගා ටෙලි නාට්‍ය, යථාකාර සන්දර්ශන වැඩසටහන් මෙම මාධ්‍ය වයිරස පෝෂණය වන සහ පවතින ක්ෂේත්‍ර වන්නේය. මිනිස් සිරුරේ පැවැත්මට සහ වර්ධනයට විනාශකාරී ලෙස බලපාන්නේ කෙසේද ඒ ආකාරයටම මාධ්‍ය වයිසර සමාජ සංහතික දේහයේ පරිහානියට බලපා එය සමාජ සංවර්ධනය සහ පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි විනාශකාරී ලෙස බලපාන්නේය.

වර්තමාන ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධන ක්‍රියාවලිය පසු වන්නේ සුවිශේෂ ගෝලීය සහ ජාතික සන්දර්භයක් තුළ බව ප්‍රකාශ කළ යුතුය; එක් අතකින් සංග්‍රාමික බටහිර ගෝලීයවාදයද අනෙක් අතින් පශ්චාත් යටත් විජිතවාදී සහ පශ්චාත් යුදවාදී ක්‍රියාවලීන්ද සක්‍රීය වෙමින් ජන ජීවිතය කෙරෙහි සහ සමාජ සංවිධාන රටාව කෙරෙහි බලපාමින් පවතින සංකීර්ණ සහ ප්‍රතිවිරෝධාත්මක ඓතිහාසික සංක්‍රාන්තික අවස්ථාවකය. එම නිසා මේ අවස්ථාවේදී ශ්‍රී ලාංකේය රූපවාහිනිය ක්‍රියා කළ යුත්තේ මේ පශ්චාත් යුද ශ්‍රී ලාංකේය සමාජයෙහි ක්‍රියාත්මක වන ගතික සහ ප්‍රවණතා හඳුනා ගනිමින් පශ්චාත් යුද අභියෝග ජය ගැනීමට අවශ්‍ය සමාජ සංහතික මාධ්‍ය සංකතිකාවක් අප රට තුළ ඇති කිරීමේ අභිලාෂයෙනි. වර්තමාන සමාජයෙහි බුද්ධිමය සහ ආධ්‍යාත්මික පරිසරය සකස් කරන මුඛ්‍ය මාධ්‍ය වශයෙන් රූපවාහිනියේ සමාජ හා ජාතික වගකීම සහ එහි යුක්තිවේදීය අභිනතිය අතිශයින්ම ඉහළය. බහු ජාතික, බහු වාර්ගික, බහු සංස්කෘතික සහ බහු ආගමික විවිධත්වය සහ සංකීර්ණතා සාමස්තික රාජ්‍ය ව්‍යූහයක් තුළ උපරිම මට්ටමින් සංවර්ධනය වීමට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිසංස්කරණය සඳහා වූ සංකතිකාවක් නිර්මාණය කිරීම මූලික අවශ්‍යතාවකි. ජාතික ඒකාග්‍රතාව, ජාතික සංහිඳියාව ජාතීන් අතර සහජීවනය සහ සාමය, සංස්කෘතික සහ ආධ්‍යාත්මික විවිධත්වය පොදු ශ්‍රී ලාංකිකත්වය, පොදු ශ්‍රී ලාංකික හැඟීම්, සංවේද්‍යතා සහ අවසාන වශයෙන් පොදු ශ්‍රී ලාංකික දෘෂ්ටිවාදයක් සහ මනෝභාවයක් ගම්‍යමාන වන ආකාරයට දෛනිකව සිදු වන සිද්ධි වාර්තා කිරීම, ඉදිරිපත් කිරීම පමණක් නොව අදාළ තත්වයන් ධෛර්යමත් වන ආකාරයට එම දෛනික සිදුවීම් අර්ථකථනය කොට පොදු දෘෂ්ටිවාදී සංවරණයක් තුළ ඉදිරිපත් කිරීම පශ්චාත් යුද ශ්‍රී ලාංකේය රූපවාහිනියේ ප්‍රධාන කාර්යභාරයකි. සමාජයෙහි ජීවත් වන ප්‍රබුද්ධ ප්‍රජාව, දේශපාලඥයින් සහ සිවිල් සමාජය ඉහත ගෙන හැර දක්වන ලද කාරණා

සම්බන්ධව පොදු ජාතික සංකතිකාවකට යොමු කිරීම සහ එය වෙනස් වන තත්ත්වයන් යටතේ අඛණ්ඩව පවත්වා ගෙන යැම අද රූපවාහිනියට අත්හළ නොහැකි වගකීමකි.

නමුත් වර්තමාන ශ්‍රී ලාංකේය රූපවාහිනිය මේ යුග අවශ්‍යතාව සහ අභියෝගය පිළිබඳව කිසිම සවිඥානකතාවක් සහ උනන්දුවක් නොදක්වනවා පමණක් නොව සමකාලීන සමාජ සංහතික රූපවාහිනී වැඩසටහන් සහ එහි ප්‍රතිපත්ති ඊට ප්‍රතිවිරෝධීව ක්‍රියාත්මක වීම උභතෝකෝටික තත්ත්වයකි. සමකාලීන රූපවාහිනිය වෙනස් කිරීම හුදු හුදෙකලා සංසිද්ධියක් නොව, එය සමකාලීන සමස්ත රාජ්‍ය මාදිලියේ සහ සමාජ සංහතික සැකැස්මෙම කොටසක් වශයෙන් සැලකිල්ලට ගෙන අවධානය යොමු කළ යුතු ගැටලුවකි.

ආශ්‍රිත ග්‍රන්ථ -

1. Barker chris (1997), global Television : An Intruduction, Oxford : Black – Well.
2. එංගල්ස් ෆෙඩරික්, වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනයවීමේදී ශ්‍රමය ඉටු කළ කාර්ය කොටස, මාක්ස් සහ එංගල්ස්, තෝරාගත් කෘති, වෙළුම් හතර, වෙළුම 3 ප්‍රගති ප්‍රකාශන මන්දිරය, මොස්කව්, 1982, පිටුව 10
3. Hill Annette (2007 )' Reality TV – Audiences and popular factual Television" Routledge
4. Brathes, Roland (1981) in Untying the text, London Routledge
5. වීරසිංහ ටී. (2011), මාක්ස්වාදී සහ නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.